Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු පවතින තනතුරු වර්ග හා ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ :-

| | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | කාර්යාල කාර්ය සහායක (III ශ්‍රේණිය) | 01 | රා.ප.ච. 3/2016 අනුව PLI-2016 වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබිය යුතු ය. |
| 02. | ජල වැද්දුම්කරු (III ශ්‍රේණිය) | 01 | රා.ප.ච. 3/2016 අනුව PL2-2016 වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් (06)ක් සමත් වී තිබිය යුතුය. අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ. |

*පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරු බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.
(iii) සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය..
(iv) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.
(v) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
(vi) තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*බඳවාගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු පදනම් කරගනිමින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක සිටින සේවකයන්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර තුනක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩ ඉම සමත් විය යුතුය.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලටද දෙපාර්තමේන්තු නියෝගවලටද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටියි.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කරන ලද අයදුම්පතක් 2017.11.24 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, කඹුරුපිටිය". යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපතක් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළයුතුය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.)
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්
(v) පළපුරුද්ද පිළිබඳ සහතිකය
(vi) කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්

බී. රම්‍යලතා,
ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 12 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
කඹුරුපිටිය.

....................................තනතුර සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම (මුලකරු සමග නම) :____________________________________.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :____________________________________.

03. තැපැල් ලිපිනය :____________________________________.

04. දුරකථන අංකය :____________________________________.

05. උපන් දිනය : වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

06. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

08. ස්ත්‍රී/පුරුෂ භාවය :____________________________________.

09. විවාහක/අවිවාහක බව :____________________________________.

10. ජාතිය :____________________________________.

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :__________________________.

12. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා. පෙළ) විභාගය

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ........................................ | .................... | ........................................ | .................... |
| ........................................ | .................... | ........................................ | .................... |
| ........................................ | .................... | ........................................ | .................... |
| ........................................ | .................... | ........................................ | .................... |
| ........................................ | .................... | ........................................ | .................... |

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :..........................................................................................................................................................................
..........................................................................................................................................................................................................

12. ඔබ දැනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :

(i) දැනට දරන තනතුර :____________________________________

(ii) එම තනතුරට පත් වූ දිනය :____________________________________

(iii) එම පත්වීමේ ස්වභාවය :____________________________________

(ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත ද) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙමගින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය ..................................